දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகானக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 12 ශ්‍රේණිය
දෙවන වාර පරීක්ෂණය 2019 මාර්තු
கல்விப் பொதுத் தராதர(உயர்தரப்)பரீட்சை 2019 மார்ச் தரம் 12 இரண்டாம் தவணைப் பரீட்சை
General Certificate of Education(Adv.Level) Grade 12 Second Term Test 2019 March

භූගෝල විද්‍යාව - I
Geography - I

22 S I

පිළිතුරු පත්‍රය

I කොටස

බහුවරණ ප්‍රශ්න

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | **5** | 11 | **3** | 21 | **1** |
| 2 | **1** | 12 | **2** | 22 | **1** |
| 3 | **3** | 13 | **1** | 23 | **3** |
| 4 | **5** | 14 | **3** | 24 | **4** |
| 5 | **4** | 15 | **1** | 25 | **2** |
| 6 | **1** | 16 | **3** | 26 | **5** |
| 7 | **2** | 17 | **3** | 27 | **5** |
| 8 | **5** | 18 | **5** | 28 | **1** |
| 9 | **5** | 19 | **4** | 29 | **3** |
| 10 | **3** | 20 | **3** | 30 | **5** |

II කොටස

01. (i) X-Y කඳු වැටිය

P-Q කන්ද/හුදෙකලා කන්ද (ලකුණු 02)

(ii)B අක්ෂාංශ සහ දේශාංශ ඡේදනය වන ස්ථානය

D වැව (ලකුණු 02)

(iii)3 1.ගෙවතු වගාව

2.වී වගාව (ලකුණු 02)

(iv) කි.මී.1.9 (ලකුණු 03)

(v) 90 ජාතික බණ්ඩාංක

95 ජාතික බණ්ඩාංක

$60^{0} 00^{/}$ ගෝලීය බණ්ඩාංක/අක්ෂාංශ (ලකුණු 03)

(vi) භෞතික සාධක

1.තැනිතලා භූමිය

2.සාරවත් පස


මානව සාධක

1.ප්‍රධාන හා අප්‍රධාන මාර්ගවලින් සමන්විත මාර්ග පහසුකම් (ලකුණු 04)

(vi) දියුණු මාර්ග ජාලයක් පැවතීම

ඉහළ කෘෂිකාර්මික සංවර්ධනයක් දක්නට ලැබීම (ලකුණු 04)

02.




03. (i) 1:25000 (ලකුණු 02)

(ii) නිවැරදි රේඛීය පරිමාණයට ලකුණු ලබා දිය යුතු ය (ලකුණු 03)

(iii) 12 ශ්‍රේණිය ගුරු අත්පොත 214 පිටුව බලන්න (සම්මත වර්ණ භාවිත කර ඇත්නම් පමණක් ලකුණු ලබා දිය යුතු ය.) (ලකුණු 05)

(iv)


a.1.එක් තේමාවක් පිළිබඳව පුළුල් අවබෝධයක් ලැබිය හැකි වීම
2.එක් ප්‍රදේශයක එක් තේමාවක් දෙස සමස්ථයක් ලෙස බැලීමේ හැකියාව
3.එකම තේමාවක් දක්වෙන සිතියම් කිහිපයක් මගින් කාලික වෙනස්කම් නිරූපණය කිරීමේ හැකියාව
4.එක් තේමා සිතියමක් තුළ කිසියම් විචල්‍යයක කාලික වෙනස්කම් දක්විය හැකි වීම
5.කුඩා පරිමානයේ සිතියමක් නිසා පරිහරණය කිරීමේ පහසුව (ලකුණු 04)

b.1.තිත් සිතියම් නිර්මාණය කිරීමේ දී පරිපාලන ඒකකයන්ට අනුරූපව විචල්‍යයන්ට අදාළ දත්ත ලබා ගතයුතු වීම
2.එක් තිතකින් නිරූපණය කරන වටිනාකම
3.තිතක විශාලත්වය
4.තිත් සාථනගත කිරීම (ලකුණු 06)

04.(i) භූගෝලීය තොරතුරු පද්ධතියක් යනු භූගෝල විද්‍යාත්මක දත්ත නැතිනම් ක්ෂේත්‍රීය සම්බන්ධතාවයක් සහිත දත්ත කාර්යක්ෂමව ග්‍රහණය කිරීම, ගබඩා කිරීම, යාවත්කාලීන කිරීම,සකස් කිරීම,විශ්ලේෂණය කිරීම හා ප්‍රදර්ශනය කිරීම යන ක්‍රියාකාරීත්වයන්ගෙන් යුතු පරිගණක මෘදුකාංග හා පරිගණක දෘඩාංගවලින් සමන්විත සංවිධානාත්මක එකතුවකි. (ලකුණු 03)

(ii)1.දත්ත 2.දෘඩාංග 3.මෘදුකාංග 4.මානව සම්පත් 5.ක්‍රමවේද (ලකුණු 05)

(iii)




දෛශික දත්ත ආකෘතිය :
භූ ලක්ෂණ සිතියමක අඩංගු සියලුම භූ ලක්ෂණ ලකෂ්‍ය,රේඛා,බහු අශ්‍ර භාවිතයෙන් ඉදිරිපත් කිරීම මෙහි ක්‍රමවේදයයි.කිසියම් රූප මිතියක් වඩාත් නිර්වද්‍ය ආකාරයට අංකනය කළ හැකි මාධ්‍යකි. ඛණ්ඩාංක මත පදනම්ව සිතියමෙහි අඩංගු භූ ලක්ෂණ අංකනය කරමින් පරිගණකය තුළ ගබඩා කිරීම මෙහි දී සිදු වේ.

**සිව්රුස් දත්ත ආකෘතිය:**

අදාළ ප්‍රදේශය තීරු හා පේළි ඇසුරෙන් කොටු රටාවකට පරිවර්තනය කොට ඒ සෑම කොටුවක් ම නිරීක්ෂණ ඒකකයක් වශයෙන් සැලකීම සිව්රුස් දත්ත ආකෘතියේ මූලිකම ලක්ෂණය වේ.යථා ලෝකයේ පවතින ක්ෂේත්‍රීය රටාවන් සරලව පරිගණක ගත කිරීමේ හැකියාව මෙහි පවතී.මෙවැනි එක් කොටුවක් පික්සලයක් ලෙස හඳුන්වයි.සිව්රුස් දත්ත ආකෘතිය විවිධ සංඛ්‍යාත්මක වටිනාකම් සහිත පික්සල්වලින් සමන්විත වේ.සෑම පික්සලයක් මගින් ම පිහිටීම මෙන් ම පික්සලයට අදාළ වටිනාකම නිරූපණය කෙරේ.

(ලකුණු 06)

(iv)1. පාරිසරික අධ්‍යයන

2.සෞඛ්‍යය ක්ෂේත්‍රය

3.ස්වභාවික සම්පත් කළමණාකරණය

4.නාගරික අධ්‍යයන

5.ව්‍යාපාරික ක්ෂේත්‍රය

6.වන ජීවී කළමණාකරණය

7.පහසුකම් කළමණාකරණය

(ලකුණු 06)

(ප්‍රශ්න පත්‍රයේ මෙම ප්‍රශ්නය ප්‍රශ්න අංක 04 ලෙස නවැරදි විය යුතු ය.)

## භූගෝල විද්‍යාව – II පිළිතුරු පත්‍රය

### I කොටස භෞතික භූගෝල විද්‍යාව

1.

(i) සංරචක රාශියක් එකිනෙකට සම්බන්ධතාවෙන් යුතුව නිශ්චිත සීමාවක් තුළ ක්‍රියාත්මක වන ව්‍යුහයකි. (ලකුණු 02)

(ii)1.හුදෙකලා :සෞරග්‍රහ මණ්ඩලය,විශ්වය


2.ආවෘත පද්ධතිය :පෘථිවි පද්ධතිය

3.විවෘත පද්ධති:වෙරළ පද්ධතිය , ජලවහන ද්‍රෝණි

වර්ග කිරීම ලකුණු 03

විස්තර කිරීම ලකුණු 03 (ලකුණු 06)

(iii)




පෘථිවියෙහි ඝන පාෂාණවලින් සමන්විත ඉහළ කොටස ශිලාගෝලය ලෙස හඳුන්වයි.මෙයට කබොල සහ ඉහළ ප්‍රාවරණය අයත් වේ.කබොල මහාද්වීපික කබොල සහ සාගරික කබොල ලෙස හැඳින් වේ. සාගරික කබොල බැසෝල්ට් නැමති පාෂාණයෙන් නිර්මාණය වී ඇති අතර මහාද්වීපික කබොල ග්‍රැනයිට්වලින් සමන්විත වේ.මහාද්වීපික කබොල සියල් ස්ථරය ලෙසත් සාගරික කබොල සිමැග් ස්ථරය ලෙසත් හඳුන්වයි. සියල් සහ සිමැග් ස්ථර වෙන් කෙරෙන කලාපය කොන්රඩ් අසන්තතිය ලෙස හඳුන්වයි. (ලකුණු 06)

(iv)

1. පොසිල ඉන්ධන දහනය

2.අධි කාර්මීකරණය

3.කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය


4.වනහරණය (ලකුණු 06)

02

(i) 1.මහාද්වීපික කබොල

2.සාගරික කබොල (ලකුණු 02)

(ii)





ප්‍රාවරණය, ඉහළ ප්‍රාවරණය සහ පහළ ප්‍රාවරණය යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වේ.මෙම කොටස යකඩ සහ මැග්නීසියම් බහුල සිලිකේට් පාෂාණ වලින් සමන්විත ය.භූ කම්පන, යමහල් ක්‍රියාකාරිත්වය,කඳු නිර්මාණය ,මහාද්වීප ප්ලාවිතය යන භූ භෞතික සංසිද්ධිවලට සාක්ෂි මෙම ස්ථරයෙන් හමු වේ.මෙය මොහොරොවිසික් අසන්තතිය දිගේ සිමා ස්ථරයේ සිට පහළට කි.මී.2900ක් දක්වා ගැඹුරට විහිදී යයි.

රූප සටහනට ලකුණු 02

විස්තර කිරීම ලකුණු 04 (ලකුණු 06)

(iii)




උප බෙදීම් සහ උදාහරණ සහිතව විස්තර කළ යුතු වේ.

රූප සටහනට ලකුණු 02

විස්තර කිරීම ලකුණු 04 (ලකුණු 06)

(iv)1.ගලන ජලය

2.ග්ලැසියර්

3.සුළං


4.සාගර තරංග

එකකට ලකුණු 2 බැගින් (ලකුණු 06)

03

(i) 1.නිම්න,නෙරු,දිය ඇලි,වැල්ල,දඹය,වැලි වැටි,සර්ක,මොරේන,උවාලා,පෝල්ජේ වෙනත් ඕනෑම නිවැරදි පිළිතුරකට ලකුණු දිය යුතු ය. (ලකුණු 02)

(ii)





ප්‍රාවරණයෙහි මතුපිට පවතින අධික තාපය හේතුවෙන් මූල ද්‍රව්‍ය උණු වී ද්‍රව ස්ථරයක් බවට පත්ව ඇත. මෙම කලාපයෙන් නිකුත් කෙරෙන ශක්තිය හෙවත් සංවහන ධාරා හේතුවෙන් ඊට ඉහළින් ඇති පාෂාණ තැටි විවිධ දිශාවලට පා වී යයි.පෘථිවි පෘෂ්ඨය දෙසට ඉහළ නගින සංවහන ධාරා සිසිල් වී නැවත පෘථිවි අභ්‍යන්තරයට ගමන් කරයි.මෙය චක්‍රීය ක්‍රියාවලියකි.


රූප සටහනට ලකුණු 02

විස්තර කිරීම ලකුණු 04 (ලකුණු 06)

(iii)




අභිසාරී තැටි මායිම



අපසාරී තැටි මායිම

අභිසාරී තැටි මායිම්ඃ

එකිනෙකට මුහුණලා ගමන් කරන තැටි මායිම් වේ.සාගරික තැටියක් හා මහාද්විපික තැටියක් හමුවන සිමාවක දී සාගරික තැටිය මතින් මහාද්වීපික තැටි ගමන් කිරීම නිසා සාගරික තැටිය ගිලා බැසීමෙන් ආගාධ නිර්මාණය වේ. උදාඃටොංගා ආගාධය,මරියානා ආගාධය

සාගරික තැටියක් ප්‍රාවරණය දක්වා ගිලා බැසීමෙන් පාෂාණ තැටිය උණු වී මැග්මා ගලා ඒමෙන් යමහල් දූපත් නිර්මාණය වේ.

අපසාරී තැටි මායිම්ඃ


පාෂාණ තැටි එකිනෙක විරුද්ධ දෙසට ගමන් කිරීම අපසාරී තැටි මායිම් ලෙස හඳුන්වයි.හු තැටි එකිනෙකින් ඈත් වීමේදී තැටි මායිම් ඔස්සේ ලාවා ගලා ඒමෙන් නව සාගරික පතුල් නිර්මාණය වන අතර සාගරික වැටි ද නිර්මාණය වේ. මේවා මධ්‍ය සාගරික වැටි ලෙස හඳුන්වයි. උදාඃමධ්‍ය අත්ලාන්තික් සාගරික වැටිය.

රූප සටහන් සඳහා ලකුණු 02
විස්තර කිරීම ලකුණු 04 (ලකුණු 06)

(iv)


| | |
|---|---|
| 1.උඩු නැමි මඩුල්ල සහ යටි නැමි මඩුල්ල | නැමි |
| 2.උළැගි විභේදය | විභේද |
| 3.ආස්තර | අක්‍රාන්ත යමහල් හු රූප |
| 4.සංයුක්ත යමහල් | නිෂ්ක්‍රාන්ත යමහල් හු රූප |

උඩු නැමි මඩුල්ල සහ යටි නැමි මඩුල්ල




උඩු නැම්මක කුඩා උඩු නැමි සහ යටි නැමි රාශියක් පිහිටි විට එය උඩු නැමි මඩුල්ලක් ලෙස ද යටි නැම්මක කුඩා උඩු නැමි සහ යටි නැමි රාශියක් පිහිටි විට එය යටි නැමි මඩුල්ලක් ලෙස ද හඳුන්වයි







ඔත් නැම්මකට අධික තෙරපීමක් එල්ල වන විට එහි ඉහළ බාහුව පහළ බාහුව මත පතිත වීමෙන් උළැගි නැම්ම නිර්මාණය වේ. තවදුරටත් ඇතිවන තෙරපීම හේතුවෙන් ඉහල බාහුව උළැගි තලය දිගේ ඉදිරියට ගමන් කරයි.බාහු දෙක වෙන්වන සීමාව උළැගි විභේදය ලෙස හඳුන්වයි.

ආස්තර



පෘථිවි අභ්‍යන්තරයේ සිට ගලා එන මැග්මා පාෂාණ ස්ථර අතර පිහිටි හිස් අවකාශීය ප්‍රදේශවල තිරස් අතට තැම්පත් වීමෙන් ආස්තර නිර්මාණය වේ.

සංයුක්ත යමහල




ප්‍රධාන යමහල් මුඛයට අමතරව කුඩා යමහල් ගණනාවකින් මැග්මා නිකුත් කරයි නම් එය සංයුක්ත යමහ ලක් ලෙස හඳුන්වයි


වර්ග කිරීම ලකුණු 01
රූප සටහන් සඳහා ලකුණු 01
විස්තර කිරීම ලකුණු 04 (ලකුණු 06)

04.

(i)




(ii) **(ලකුණු 02)**




**1.අවලම්භනය :ඉතා සියුම් ද්‍රව්‍ය ජලයේ ඉහළ කොටසෙහි ගමන් කිරීම**

**2.ද්‍රාවණය:ඛනිජ වැනි දෑ ජලයේ දියවෙමින් ගමන් කිරීම**

**3.පෙරළී ගමන :විශාල පාෂාණ ස්කන්ධ ගං පත්ල දිගේ පෙරළෙමින් ගමන් කිරීම**

**4.පිනුම් ගමන: තරමක් විශාල පාෂාණ කොටස් ගං පත්ල දිගේ පනිමින් ගමන් කිරීම**

රූප සටහන් සඳහා ලකුණු 02

**විස්තර කිරීම ලකුණු 04 (ලකුණු 06)**

**(iii)ද්‍රාව ක්‍රියාව :නිරන්තරයෙන් ම ගලා යන ජලයෙහි දිය වී ඇති කබොනික් අම්ල සහ ඔක්සිජන් පාෂාණවල ඇති ඛනිජ සමග ගැටීමෙන් පාෂාණ විඛාදනයට ලක්වීමයි.**


**සර්ෂණය: ගංගා භාරයට අයත්වන නොයෙකුත් ද්‍රව්‍ය එකිනෙක ගැටීමයි.**

**සංඝර්ෂණය: ගංගා භාරය මගින් ගංගාවේ පතුල,දෙපස ඉවුරු සහ ගංගාව දිගේ ඛාදනය වීමට හේතුවන ගැටීමයි.**


**(2 බැගින් ලකුණු 6)**

**(iv).ඛාදිත:ගල් වන , දොරු**


**නිධි සාධිත :හැඩපළු ගංගා, දුනුවිල් (ලකුණු 02)**





**ගංගාවක වෘද්ධ අවස්ථාවේ බෑවුම් අනුක්‍රමණය ඉතා අඩු වීම හේතුවෙන් ගං භාරය ගංගාව මධ්‍යයේ තැම්පත් කිරීම කිරීමෙන් හැඩපළු ගංගාව නිර්මාණය වේ.**




**ගං ජලය සමග ගමන් කරන පාෂාණ ද්‍රව්‍ය ගං පත්ලෙහි සට්ටනය වීමෙන් මෘදු පාෂාණ ඉවත් කිරීම නිසා නිර්මාණය වන ආවාට වේ.**




**ගංගාවක් දඟර ගසමින් ගමන් කිරීමේ දී අතුලු ඉවුරු ඛාදනය වීමෙන් ගංගාව ඍජු ගමන් මගක් ගැනීමෙන් පසු ගං දඟරය ගංගාවෙන් වෙන් වී දුන්නක හැඩය ගත් විලක් බවට පත් වූ විට එය දුනු විලක් ලෙස හඳුන්වයි.**




**ගංගාවක් දෘඩ පාෂාණ ස්කන්ධ හේතුවෙන් ඉතාම පටු නිම්නයක් මස්සේ ගලා යයි නම් එය දොරුවක් ලෙස හඳුන්වයි.**

රූප සටහන් සඳහා ලකුණු 02

**විස්තර කිරීම ලකුණු 04 (ලකුණු 06)**

The National e-learning Portal for the General Education

## II කොටස මානුෂ භූගෝල විද්‍යාව

**05.**

(i) 1.දිගු කාලයක් තිස්සේ මන්දගාමී වර්ධනයක් සිදු වූ අවධිය.
2.ඉතා කෙටි කායක් තුළ සීඝ්‍ර වර්ධනයක් සිදු වූ අවධිය (ලකුණු 02)

(ii)භෞතික සාධකඃපස,ජලය,දේශගුණය.ස්වාභාවික සම්පත්,භූ විෂමතාව
මානව සාධකඃදේශපාල ස්ථාවර භාවය,යටිතල පහසුකම්,සේවා පහසුකම්
(ලකුණු 06)

(iii) කිසියම් රටක් ඉහළ උපත් අනුපාතිකයක් පවතීනම් එය එම රටෙහි ජන සංඛ්‍යාව ඉහළ යැමකට හේතුවන අතර එය පාලනය සඳහා උපත් අධෛර්යමත් කිරීමේ ජනවිද්‍යාත්මක ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවිය යුතු වේ.රටක උපත් අනුපාතිකය පහළ අගය ක් ගනී නම් එය ශ්‍රම බලකාය කෙරෙහි බලපාන බැවින් උපත් ධෛර්යමත් කිරීමේ ප්‍රත්පත්ති ක්‍රියාත්මක කළ යුතු වේ.රටක මරණ අනු පාතිකය ඉහළ අගයක් ගැනීම නිසා ජන සංඛ්‍යාව අඩු වී යන අතර එය රටේ මානව සම්පත සම්බන්ධයෙන් සංවර්ධන ක්‍රියාවලිය තුළ ගැටලු මතු කරයි.එය පහත හෙලීම සඳහා සෞඛ්‍ය අංශය දියුණු කිරීම වැනි ක්‍රියා මාර්ග ගත යුතු වේ.මේ ආකාරයට එක් එක් රටවල පවත්නා ජනවිද්‍යාත්මක විචලනයන් ලෝක ජන සංඛ්‍යාවේ වෙනස්වීම නැතිනම් ගතිකත්වය කෙරෙහි බලපායි. (ලකුණු 06)

(iv) ජන සංඛ්‍යාව වයස්ගත වීමඃ
1.වයස්ගත වූවන් රැකබලා ගැනීම සඳහා විශාල මුදලක් වැය වීම(සෞඛ්‍ය පහසුකම්,විශ්‍රාම වැටුප්)
2.පවුල තුළ ඇතිවන දරිද්‍රතාව
3.වැඩිහිටියන් අසරණ භාවයට පත්වීම

ජනතාව අවතැන් වීම
1.අවතැන් වූවන් රැකබලා ගැනීම සඳහා විශාල මුදලක් දැරීමට සිදුවීම
2.නැවත පදිංචි කිරීම සඳහා විශාල මුදලක් අවශ්‍ය වීම
3.ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය අඩපණ වීම
4.අවතැන් වූවන් අතර ඇතිවන මානසික අවපීඩනය
5.ළමා හා කාන්තා අපචාර
6.ලෙඩ රෝග ව්‍යාප්තිය

දරිද්‍රතාව
1.දුප්පත් ජනතාවට සහන සැලසීම සඳහා රටේ අරමුදල් විශාල ලෙස වැයවීම
2.ආර්ථික ක්‍රියාවලියට අවශ්‍ය නීරෝගී ශ්‍රම බලකාය සීමා වීම (ලකුණු 06)



**06.**

(i) 1.අභ්‍යන්තර සංක්‍රමණ 2.බාහිර සංක්‍රමණ
(ලකුණු 02)

(ii) 1.සංවර්ධන විෂමතා
2.ස්වභාවික සම්පත්වල ව්‍යාප්තිය
3.දේශපාලන ස්ථාවරභාවය
4.ස්වාභාවික විපත් (ලකුණු 06)

(iii) 1.සරණාගත ජනයා රැකබලා ගැනීමට සිදුවීම
2.දේශීය ජන කණ්ඩායම් සමග ඇතිවන ගැටුම්
3.පාරිසරික ගැටලු
4.රටේ ජන සංයුතිය හා සම්බන්ධ ගැටලු
5.සංස්කෘතික බලපෑම් (ලකුණු 06)

(iv).1.රටතුළ ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම
2.නීති විරෝධී සංක්‍රමණවලට එරෙහිව දැඩි නීති රීති ක්‍රියාත්මක කිරීම
3.නීත්‍යානුකූල ලෙස විදේශගතවීම සඳහා අවශ්‍ය පසුබිම සැකසීම
4.රටතුළ දේශපාලන ස්ථාවර භාවය ඇති කිරීම
5.රට තුළ සමාජයීය සංවර්ධනයක් ඇති කිරීම
(ලකුණු 06)

07.

(i)දළ මරණ අනුපාතිකය =

$$\frac{\text{මරණ සංඛ්‍යාව}}{\text{මධ්‍ය වාර්ෂික මුළු ජන සංඛ්‍යාව}} \times 1000$$

(ලකුණු 02)

(ii) 1.කාන්තාවන් වැඩිදුර අධ්‍යාපනයට යොමු වීම
2.කාන්තාවන් රැකියාවලට යොමුවීම
3.දරුවන් බිහිකිරීම හා සම්බන්ධ සංකුලතා සහිත කාන්තාවන්ගේ සංඛ්‍යාව ඉහළ යෑම
4.පවුල් සංවිධාන කාර්යයන් සම්බන්ධයෙන් ජනතාව දැනුවත්වීම
5. දරුවන් රැකබලා ගැනීම සඳහා විශාල වියදමක් දැරීමට සිදු වීම (ලකුණු 06)

(iii) 1.කාන්තාවන් අතර රැකියා වියුක්තිය ඉහළ යෑම
2.කාන්තාවන් අභිමුඛ කරගත් අධ්‍යාපනික,වෘත්තීය පුහුණු වැඩ සටහන් සඳහා අවධානය යොමු කළ යුතු වීම
3.අධික ශ්‍රමය වැය කළ යුතු වෘත්තීන් සඳහා කාන්තාවන් යෙදවීමෙන් අපේක්ෂිත ආර්ථික අරමුණු ඉටු නොවීම
4.කාන්තාවන් සවිබල ගැන්වීමේ වැඩසටහන් ක්‍රියාවට නැංවිය යුතු වීම (ලකුණු 06)

(iv) 1.ග්‍රාමීය ප්‍රදේශ සඳහා සංවර්ධන වැඩ සටහන් ඇති කිරීම
2.ග්‍රාමීය ප්‍රදේශ සඳහා සම්පත් බෙදා හැරීම
3.ග්‍රාමීය ප්‍රදේශවල සේවා පහසුකම් ඉහළ නැංවීම
4.ග්‍රාමීය ප්‍රදේශවල රැකියා උත්පාදන වැඩ සටහන් ක්‍රියාවට නැංවීම
5.ප්‍රධාන නගර යා කරමින් අධිවේගී මාර්ග හා දුම්රිය මාර්ග ඉදි කිරීම
6.දේශපාලන ස්ථාවර භාවය ඇති කිරීම
(ලකුණු 06)

08.

(i)

නිවාස ගොඩනැගිලි පමණක් නොව වැටවල්, මාර්ග ගබඩා, ගොවිපළවල් ආදී සියල්ලක් ම ඇතුලත්ව මිනිසා විසින් ප්‍රයෝජනයට ගනු ලබන සියලු දෙයින් ද විවිධත්වයක් ඇති පුද්ගලයින් සමූහයකින් ද සමන්විත වූවකි. (ලකුණු 02)

(ii)

මානව සංහතියේ එක් එක් යුගවල හා ශිෂ්ටාචාර අශ්‍රිතව ජනාවාස විකාශනය වූ ආකාරය උදාහරණ දෙමින් විස්තර කළ යුතු වේ.

12 ශ්‍රේණිය ගුරු අත්පොත 129 ,130 පිටු බලන්න
(ලකුණු 06)

(iii) 1.නිරන්තරයෙන් ජනයා පදිංචියට පැමිණීම
2.ද්විතීයික හා තෘතියික ආර්ථික කටයුතුවල සිදුවන්නා වූ වර්ධනය
3.යටිතල පහසුකම්වල ඇතිවන්නා වූ සංවර්ධනය
4.උප නගර හා ඇතිවන පුළුල් සම්බන්ධතාවයන්
5.පරිපාලන කටයුතුවල සිදුවන විමධ්‍යගතකරණය
(ලකුණු 06)

(iv)1පරිසර දූෂණය
2.සමාජ විරෝධී ක්‍රියා
3.නාගරික ප්‍රදේශවල සම්පත් මත අධික පීඩනය
4.පැල්පත් හා මුඩුක්කු බිහිවීම
5.ඉහළ නාගරික දරිද්‍රතාව
6.නගර සංවර්ධනය අඩාලවීම
7.නාගරික ප්‍රදේශවල රැකියා වියුක්තිය ඉහළ යෑම

(ලකුණු 06)

The National e-learning Portal for The General Education